Learning Resource Center
R
De Mazenod College
Kandana

29 . 03 . 2016

ද මැසිනොද් විදුහල - කඳාන

De mazenod college - kandana

සිංහල භාෂාව හා සාහිත්‍යය I

පළමුවාර පරීක්ෂණය 2016 — 9 ශ්‍රේණිය

I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

1) ඉපැදුණු දේශය මුල්කොට ගෙන ඒ පිළිබඳ ව සිතෙහි පහළ වන අභිමාන පූර්වක ගෞරවාන්විත ඇල්ම
   1. සතත අභ්‍යාසයයි
   2. දේශ වාත්සල්‍යයි
   3. චිත්තාකර්ෂණියයි
   4. ගෞරවාන්විතයි

2) පද හතරකට වඩා ඇති, ශබ්ද රසය තියුණු වන ආකාරයෙන් පද දිගට ඇදී යන්නේ,
   1. සීපදයයි
   2. ජන කවියයි
   3. ඊකා සීපදයයි
   4. පාරු කවියයි

3) ප්‍රවෘත්තියක අනිවාර්ය අංග පදනම් කර ගන්නා අනුපිළිවෙළ වන්නේ,
   1. කෙසේද, කවදා ද, කවුද, කුමක්ද, කොහෙදී ද, කවර හෙයින් ද
   2. කවුද, කුමක්ද, කොහිදීද, කවදාද, කවර හෙයින්ද, කෙසේද
   3. කවදාද, කෙසේද, කුමක්ද, කවුද, කොහිදීද, කවර හෙයින්ද
   4. කවුද, කොහිදීද, කුමක්ද, කවදාද, කෙසේද, කවර හෙයින්ද

4) ප්‍රවෘත්තියක් ලිවීමේ දී ප්‍රවෘත්ති පෙළ ගැස්විය යුත්තේ,
   1. අන්තරාවෘත්ත පිරමිඩාකාරයෙනි
   2. කේතුවක් ආකාරයෙනි
   3. අන්තරාවෘත්ත ප්‍රිස්මාකාරයෙනි
   4. සංක්ෂිප්ත ආකාරයෙනි

5) පුවත්පත් වාර්තාකරණය සඳහා සුදුසුම අවස්ථාවකි.
   1. ආහාර පිසීමේ අවස්ථාව
   2. විවේක ගැනීමේ අවස්ථාව
   3. ශිෂ්‍ය නායක නායිකාවන දිවුරුම් දීමේ අවස්ථාව
   4. පෙළ ගැසීමේ අවස්ථාව

6) අපේ රටේ අලුතින් ද්විතීයික පාසල් දහසක් පිහිටුවීමේ .......................................... වන්නේ විද්‍යා, ගණිත, තාක්ෂණවේදය යන විෂය ක්ෂේත්‍ර යටතේ රටේ අධ්‍යාපනය නංවාලීමයි.
   1. ආරක්ෂාව
   2. අපේක්ෂාව
   3. උපේක්ෂාව
   4. පරීක්ෂාව

7) ජාතික .......................................... ඇති කරලීම පිණිස බොහෝ කාව්‍ය රචනා ද ලිය වී ඇත.
   1. අවබෝදය
   2. දුරවබෝධය
   3. උද්ධාමය
   4. ප්‍රබෝධය

8) සියලු ප්‍රවෘත්ති හා සිද්ධි මුල් කර ගත් දැනුම් සම්භාරයෙන් වැඩි ම කොටසක් අප විසින් ග්‍රහණය කර ගනු ලබන්නේ,
   1. රූපවාහිනියෙනි
   2. ගුවන්විදුලියෙනි
   3. පරිගණකයෙනි
   4. සවන් දීමෙනි

9) විරාම ලක්ෂණ භාවිතයේ දී තිත් හතර යෙදෙන්නේ,
   1. සම්පූර්ණ ප්‍රකාශනයක යම් තැනක අර්ථය පැහැදිලි කරනු සඳහා
   2. උද්ධෘත පාඨයකින් අග කොටස් අත් හළ බව දැක්වීම සඳහා
   3. උද්ධෘත පාඨයකින් මුල කොටස් අත් හළ බව දැක්වීම සඳහා
   4. පාඨයකින් අත් හැරුණු අකුරක් දැක්වීම සඳහා

10) සිංහල අක්ෂර මාලාවේ ඌෂ්ම අක්ෂර යෙදෙන නිවැරදි පිළිවෙළ වන්නේ.

1. ෂ, ශ, ස
2. ශ, ස, ෂ
3. ශ, ෂ. ස
4. ස, ශ. ෂ

11) " ෂ " අක්ෂරයට පෙර යෙදෙන අකුරු ද්විත්වයකි.

1. ණ, ඩ
2. ළ, ළු
3. ක, ර
4. ෆ, ඇ

12) " පුංචි කුරුල්ලා, පනිද්දී සෙමින් දුවයි, හෙවත් " ඉහත වචන කවර ව්‍යාකරණ ගණයට අයත් ලෙස පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න

1. ක්‍රියා විශේෂණ, නාම පද, මිශ්‍ර ක්‍රියා, උපසර්ග
2. නිපාත, උපසර්ග, ප්‍රත්‍ය, ආශිර්වාදිත ක්‍රියා
3. නාම විශේෂණ, අසම්භාව්‍ය ක්‍රියා, ක්‍රියා විශේෂණ, නිපාත
4. නිත්‍ය බහු වචන, ස්ත්‍රී ලිංග, සර්ව නාම. අතීත කාල

13) සරසවි ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් නවක වදය හෙළා ...............................................

1. දකිමු
2. දකින්නාය
3. දකිමි
4. දකිති

14) ගංගා දෙගොඩතලා ගලා ...............................................

1. යන්නාය
2. යන්නාහු
3. යයි
4. යන්න

15) කටුස්සාගේ කාරේ රත්තරන් බැන්දා වගෙයි

1. උපසර්ගයකි
2. ප්‍රත්‍යකි
3. බහු වචනයකි
4. නිපාතයකි

16) සමාන වචන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න

1. ගින්න - අග්නි, දහන, අනල, ගින්දර
2. උත්සාහය - ආයාසය. යත්නය, අධෛර්යය, වෑයම
3. මෝඩකම - මුළාව, නුගත්, මුග්ධ, සල්ලාප
4. නෙළුම - සියපත, සැවැන්දරා, අරවින්ද, සරා

17) නිවැරදි අක්ෂර වින්‍යාසය තෝරන්න

1. විශ්මය, මස්තක, ප්‍රස්තාවනා, ලක්ෂණ
2. දුශ්චරිත, අස්ථාන, කනිෂ්ඨ, ශිෂ්ටාචාර
3. ශ්‍රේෂ්ඨ, ඌෂ්ණ, කෘෂ්ණ, අෂ්ඨාංග
4. පර්ශදය, ආස්වාද, අක්ෂි, දූරේක්ෂය

18) මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වාක්‍ය තෝරන්න

1. මව් බිම රැක ගැනීම අප සතු යුතුකමකි
2. පොහෝ දිනවල සණ්ටා නාද ඇසේ
3. කෞතුකාගාරය අබියස චෛත්‍යයකි
4. ක්‍රීඩාව හා සෞන්දර්යය ජීවිතයට අවශ්‍යයි

19) සර්ව නාම පද පමණක් සහිත පද පේළිය තෝරන්න

1. මම, නිමල්, බල්ලා, තොපි
2. බලයි, නටයි, දුවයි, පනියි
3. ඇය, ඔහු, කාන්චනා, නුඹලා
4. මම, අපි, තෝ. නුඹලා

20) පහත පද අතුරින් ප්‍රථම පුරුෂ, බහු වචන ක්‍රියා පදයක් නොවන්නේ.

1. කරත්
2. කළෙමු
3. කරති
4. කළහ

## II කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. දී ඇති විස්තර අතුරින් එකක් තෝරා වචන 250 ට අඩු රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් යොදන්න

   i. මහ පොළොව තම සාරය උරා බී, එහි අග්‍ර ඵලය නිර්ලෝභී ලෙස නැවතත් මිනිසා වෙත ම පුද කර සිටියි. එහෙයින් මිනිසා උපතේ සිට මරණය දක්වා මහ පොළොවට පින් දිය යුතු බව පැවසීම වරදක් නොවේ.

   ii. දරුවන් වන අප සියලු බාධක පසෙක ලා උත්සාහවන්ත ව ඉගෙනීමෙහි යෙදිය යුතුය. එහෙයින් අප ද වඩාත් උත්සාහවන්ත විය යුතුය.

   iii. රටක සංවර්ධනය සඳහා දේශීය ආයෝජකයින්ගේ දායකත්වය ඉතා වැදගත් වේ. මෙය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට පමණක් නොව චීනය හෝ ජපානය වැනි සංවර්ධිත රට වලට ද පොදු වූ මූලධර්මයක් හා සිද්ධාන්තයකි.

   iv. ක්‍රීඩාව විනෝදාංශයකි. කායික හා මානසික සංවර්ධනය කෙරේ ද ක්‍රීඩාව බලපායි. ක්‍රීඩාවේ ලබන ජය පරාජය සමබරව විඳ ගත යුතුය. අත්දැකීම් සහභාගීත්වය හා විනෝදය ක්‍රීඩාවේ දී අගය කළ යුතුය

2. මෙම සති අන්තයේ පැවැත්වීමට නියමිත ඩෙංගු මර්දන ව්‍යාපාරයට සහභාගි වීම සඳහා ඔබ පාසලේ සිසු සිසුවියන් වෙත යැවිය හැකි දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. පිරිසිදු කිරීමට බලාපොරොත්තු වන්නේ පාසල් වත්තයි. පාසල් පරිසර කමිටුව විසින් සංවිධානය කරනු ලබන මෙය පෙ.ව 7.00 සිට ප.ව 4.00 දක්වා සිදු කෙරෙනු ඇත

3.

දූ පුතුනේ රට අපේය
දූ පුතුනේ අප රටේය //

මල් කැන් සුවඳ දේ ගල් කණුවල පිපුණු
ලේ දහදිය නටයි රණ දෙරණේ හැලුණු
ජාතිය නගන රිසියෙන් හද ඔද වැඩුණු
එනු ඉදිරියට පුත පැරකුම් දුටු ගැමුණු

දූ පුතුනේ රට අපේය
දූ පුතනේ අප රටේය //

සමනොල ගිරහ ඉර සඳ සැතපෙන තුරුම
රට වට මුහුද නිසලව නිදියන තුරුම
පුලතිසි පිළිමයට යළි පණ එන තුරුම
මේ සිරිලක් මඩළ පුත අපටයි උරුම

දූ පුතුනේ රට අපේය
දූ පුතනේ අප රටේය //

i. මෙය කවර ගීත වර්ගයකට අයත් වේද ?
ii. මෙහි සඳහන් රජවරු දෙදෙනෙකුගේ නම් මොනවාද ?
iii. මෙහි '' ගිරහ '' යන්නෙහි අර්ථය කුමක්ද ?
iv. මෙහි '' තුරු'' යන පදය කවර ව්‍යාකරණ වර්ගයකට අයත් වේද ?

4. හිස්තැන් පුරවන්න.

i. ටීකා සීපද අයත් වන්නේ .................................................. වලටය.

ii. ජනකවි සාහිත්‍යයට අයත් තවත් කවි වර්ග කිහිපයකි

.................................................................................................................... ආදිය.

iii. පැල් රකින ගොවියා සීපද ගායනා කරනුයේ ..............................................................................................

ආදිය මකා ගැනිමටය.

iv. ගැමියා සීපද පිළිබඳ අවබෝධය ලබා ගන්නේ ............................................................ සිටීමෙනි.

v. සිංහල අටුවා ග්‍රන්ථ කිහිපයක් නම් .............................................................................. ආදියයි

vi. අටුවා තවදුරටත් පැහැදිලි කිරීම සඳහා සපයා ඇති විස්තර ..................................................

නම් වේ.

vii. පාඩමේ එන සීයාගේ නම ...................................... වන අතර පුතාගේ නම .................................. ය.

5.

i. ..........................................................................................................

එම කාලේ බැඳපු වැට ගොනු කඩලා

..........................................................................................................

නිදිමතේ කියමු සීපද ගොතලා

ii. ..........................................................................................................

මහ බෝ සෙවණයි

..........................................................................................................

මගේ උරුමයයි

iii. ..........................................................................................................

සෞභාග්‍ය නිධානය ලංකා

..........................................................................................................

සෞභාග්‍ය නිධානය ලංකා